<u>පොදු වෙළඳපොළ සඳහා මාර්ගෝපදේශ සංග්‍රාහය - වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව</u>

01. කඩ කාමර තුල ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව දැනුවත් කර අනුමැතිය ලබා ගත යුතුයි.
02. මෙම දේපළ තුල සභාව නොකළ යුතුයැයි නියම කරන වෙනත් කිසිදු කටයුත්තකට නොයෙදිය යුතුය.
03. එසේම නීති විරෝධි වෙළඳාමක් හෝ නීති විරෝධි කවර ක්‍රියාවක් සඳහා හෝ එකී ස්ථානය යොදා ගැනීම ද , නිදා ගැනීම (පදිංචිය) සඳහා හෝ ආහාර පිසීමේ කටයුතු සඳහා යොදා ගැනීම ද නොකළ යුතුය.
04. කඩකුලී නිසි පරිදි මාසිකව ගෙවිම සිදුකල යුතුය.
05. බාහිර පාර්ශවයන් සමඟ රංඩු සරුවල් විම, පරුෂ වචනයෙන් බැන වැදිම, කලකෝලහාල ඇති කිරිම හා අනුබල දිම කිසිදු විටකත් නොකල යුතුය. සාමය කඩවන ලෙස හැසිරේ නම් නිතීමය කටයුතු කරනු ලැබේ.
06. බදු දේපළ තුල මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හෝ භාවිතා කර පැමිණිම තහනම් ය.
07. කඩ කාමරය තුල පවත්නා බදුකරු සතු දේපළ සඳහා රක්ෂණාවරණයක් හා ගිනිරක්ෂණාවරණයක් පෞද්ගලිකව බදුකරු විසින් ලබාගත යුතුය.
08. බදු දේපළ තුල බීමත්ව සිටීම, අයථා හැසිරීම හා අන්‍යයන්ට කරදරකාරි ලෙස හැසිරීම නොකල යුතුය.
09. බද්දට යටත්වන දේපළ හෝ ඒ හා බැඳුනු වෙනයම් ස්ථානයක වෙනස් කිරීම් , අළුත්වැඩියා කිරීම් , සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව සිදු නොකල යුතුය.
10. බදු ගැණුම්කරුගේ ව්‍යාපාරයට සිදුවන කවර අන්දමේ හානියක් , පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් සභාව කිසිම වගකීමකට නොබැඳේ.
11. ඔබගේ ව්‍යාපාරයට අදාල පරිසර බලපත්‍රය/වෙළඳ බලපත්‍රය ලබාගත යුතුය.
12. නියමිත බලපත්‍ර ගාස්තු/ ව්‍යාපාර බදු/ කර්මාන්ත බදු / වරිපනම් බදු හා රජයෙන් පනවනු ලබන බදු මුදල් නියමිත පරිදි ගෙවීමට කටයුතු කළ යුතුය.
13. බදු ගැණුම්කරු විසින් බදු දේපල තුළ තම ව්‍යාපාරය ලියාපදිංචි කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරිමේ සහතිකය හොදින් පෙනෙන ආකාරයෙන් ප්‍රදර්ශනය කළ යුතුය.
14. මෙම දේපළ භාවිතයේදී ජනනය වන අපද්‍රව්‍ය නිසි ප්‍රමිතියකට යටත්ව එනම් දිරන , නොදිරන , ප්ලාස්ටික් / පොලිතින් ලෙස වර්ගීකරණය කර බැහැර කල යුතුය.
15. ගිවිසුම අවලංගු කිරිමෙන් හෝ බදුකරයේ කාලය අවසන් වීමෙන් අනතුරුව එම දේපල හා අනෙකුත් සියළු දේ යථාතත්වයෙන් බදු ගැණුම්කරු විසින් සභාව වෙත භාරදිය යුතුය.
16. විදුලිය හා ජලය අරපිරිමැස්මෙන් භාවිතා කල යුතුය.
17. පොදු වෙළඳපළ භූමියෙ හි ඇති පෞද්ගලික රථ වාහන සඳහා සිදුවන අලාභහානි වෙනුවෙන් ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.
18. වැසිකිලි හා කැසිකිලි ක්‍රමවත්ව හා විධිමත්ව භාවිතා කල යුතුය.
19. බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට යටත්ව ව්‍යාපාර කටයුතු කළ යුතුය.

20. නියමිත වේලාවෙන් පසුව කඩ කාමර තුල හෝ වෙළඳපොළ පරිශ්‍රය තුල රැඳී සිටීම තහනම් වේ.
21. පාරිභෝගික රථවාහන හා ව්‍යාපාරික හිමියන්ගේ රථවාහන, රථගාල තුලට ඇතුලත් තළ යුතුය.
22. වෙළඳපොල භූමිය තුල පිහිටි පදික වේදිකාව අවහිර නොකල යුතුය.
23. වෙළඳපොළ භාරකරු හෝ සභාවේ නිලධාරීන් විසින් ලබා දෙන උපදෙස් හා නියෝග පිළිපැදිය යුතුය.
24. ඉහත මාර්ගෝපදේශ උල්ලංඝනය කරනු ලැබුවහොත් නීතිමය පියවර ගනු ලැබේ.
25. පොදු වෙළඳපොලෙහි කටයුතු සම්බන්ධයෙන් ඔබගේ අදහස්, යෝජනා හා පැමිණිලි වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කාර්යාලය වෙත හෝ අදාල උප කාර්යාලය වෙත ඉදිරිපත් කළ හැකිය.